**මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 45 - 2024**

---

**1. විගණන මතය**

**1.1** මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 45 ක 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** 2024 වර්ෂයට අදාළව මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 45 කට අදාළව විගණන වාර්තා නිකුත් කර තිබූ අතර කාරක සභා 45 සඳහා ම තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණි. මේ සඳහා හේතු වී තිබුණු ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1. 3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ඇතුළත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1981 ඔක්තෝබර් 16 දිනැති අංක 107 දරන ගොවිජන සේවා කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 30(4) වගන්තියේ සඳහන් ක්ෂය ප්‍රතිපත්තිය පරිදි යන්ත්‍රෝපකරණ හා ගොඩනැඟිලි ගත් මිල මත ක්ෂය කළ යුතු වුවත් ගොවිජන සේවා කාරක සභා 22 ක් හීනවන ශේෂ ක්‍රමයට ක්ෂය කර තිබුණි. | 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී චක්‍රලේඛය පරිදි කටයුතු කරන බව | චක්‍රලේඛයේ දක්වා ඇති ක්ෂය ප්‍රතිපත්තිය පරිදි කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 86(අ) අනුව ක්ෂය ප්‍රතිපත්තිය හෙළිදරව් කළ යුතු වුවද කාරක සභා 09 ක් විසින් ක්ෂය ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි. | 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළයෙල කරන විට අදාළ ප්‍රමිතය පරිදි කටයුතු කරන බව. | ප්‍රමිතය පරිදි ස්ථාවර වත්කම් ක්ෂය ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 69 ඡේදය අනුව වත්කමක් ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීම සඳහා සුදානම් තත්ත්වයට ගෙන ආ පසුව වුවද ගොවිජන සේවා කාරක සභා 08 ක් විසින් භාවිතය ආරම්භ නොකළ රු.526,240 ක් වටිනා වත්කම් සමාලෝචිත වර්ෂය සඳහා රු.76,382 කින් ක්ෂය කර තිබුණි. | 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළයෙල කරන විට අදාළ ගැලපීම් සිදුකරන බව හා ප්‍රමිතය පරිදි කටයුතු කරන බව. | ප්‍රමිතය පරිදි ස්ථාවර වත්කම් ක්ෂය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09 හි 15 ඡේදය අනුව පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකින් අඩු අගයට තොග ගණනය කළ යුතු වුවත්, කාරක සභා 04 ක් විසින් ශුද්ධ උපලබධි අගය සැලකිල්ලට නොගෙන පිරිවැය මත තොග අගය කර තිබුණි. | ඉදිරියේ දී ප්‍රමිතයේ මඟපෙන්වීම් අනුව කටයුතු කරන බව | ගිණුම්කරණ ප්‍රමිතය පරිදි තොග අගය කළ යුතුය. |
| (ඉ) | 2017 පෙබරවාරි 19 දිනැති අංක 15/2016 චක්‍රලේඛයෙන් සංශෝධිත 107 (සංශෝධන 05) චක්‍රලේඛය ප්‍රකාරව ගොවිජන සේවා කාරක සභා විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතු වුවද ගොවිජන සේවා කාරක සභා 09 ක් විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව ගිණුම් පිළියෙල කර ඉදිරිපත් කර තිබුණි. | ඉදිරි වර්ෂවල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කරන බව. | මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කළ යුතුය. |
| (ඊ) | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 1(48) හා (49) අනුව අවසර දී ඇති විටක හර වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව් නොකළ යුතු ය යන්න දක්වා තිබුණ ද අලවතුගොඩ ගොවිජන සේවා කාරක සභාව විසින් සමාලෝචිත වර්ෂය තුළ ලැබුණු කොන්ත්‍රාත් ආදායමට මධ්‍යස්ථාන නඩත්තු වියදම හිලවු කර රු.81,071 ක් පමණක් ආදායමට ගෙන තිබුණි. | කාරක සභාවේ අනුමැතිය ඇතිව මෙම හිලව් කිරීම සිදු කළ ඇති බව | ප්‍රමිතයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (උ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 21 (ඊ) ඡේදය පරිදි මූල්‍ය ප්‍රකාශන සමඟ ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතු වුවත් තවද ගොවිජන සේවා කාරක සභා 36 ක ගොවිජන බැංකු ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන ගොවිජන සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ උපදෙස් සහ ලබා දී ඇති ආකෘතිය අනුව ඉදිරිපත් කර ඇති බව. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. |

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ගොවිජන සේවා කාරක සභා 04 ක් කොන්ත්‍රාත් මත ලැබුණු සියයට 1 ක රැඳවුම් මුදල් රු.463,371 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ජ'නල් සටහන් මගින් 2025 වර්ෂයේ දි මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කිරීමට හා කාරක සභා අරමුදලට බලපෑම නිවැරදි කරන බව හා වර්ෂයට අදාළ වටිනාකම පමණක් ගිණුම්ගත කරන බව | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතු අතර, අදාළ ගැලපීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ඉල්ලා නියෝජ්‍ය කොමසාරිස් වෙත දන්වා ඇති බව. | |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 06 ක් විසින් සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර තැම්පතු පොලී ආදායම රු.40,821 ක් අඩුවෙන් ද, කාරක සභා 07 ක් විසින් ස්ථාවර තැම්පත් පොලී ආදායම රු.611,830 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන විට නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාළ ආදායම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු අතර, අදාළ ගැලපීම් කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 05 ක් විසින් රු.124,651 ක් කාමර කුලී ආදායම අඩුවෙන් දක්වා තිබුණු අතර කාරක සභා දෙකක් විසින් රු.13,100 ක් කාමර කුලී ආදායම වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේ දී නිවැරදි ආදායම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව | -එම- |
| (ඈ) | ගොවිජන සේවා කාරක සභා 02 ක ස්ථාවර වත්කම් අයිතම 15 ක් වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණු අතර ගොවිජන සේවා කාරක සභා 02 ක පැවති රු.379,315 ක් වූ වටිනා කොම්පෝස්ට් කැබලි කිරීමේ යන්ත්‍ර 02 ක් ගිණුම්ගත කර නොතිබුණි. | දිස්ත්‍රික් කාර්යාලයෙන් විමසා වටිනාකම් ලබාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | වත්කම් වල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී ගොවිජන බැංකු ගිණුම්කරණ මෘදුකාංගය මිලදී ගැනීම සඳහා එකක් රු.17,131 ක් බැගින් ගොවිජන සේවා කාරක සභා 14 ක් ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් නියෝජ්‍ය කොමසාරිස්ට ගෙවා තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම උපකරණ කාරක සභාව වෙත ලැබී නොතිබුණ ද එම ගෙවීම් අත්තිකාරමක් ලෙස ගිණුම්ගත නොකර රු.119,917 ක් වියදමක් ලෙස හා රු.119,917 ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේ දි නිවැරදිව ගිණුම්ගත කිරිමට කටයුතු කරන බව. | අදාළ පරිදි ගැලපීම් කර ගිණුම් නිවැරදි කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ගොවිජන සේවා කාරක සභා 16 ක ගෙවිය යුතු විගණන ගාස්තු රු.998,428 ක් වුවත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණු අතර එක් ගොවිජන සේවා කාරක සභාවක් විගණන ගාස්තු රු.3,680 ක් වැඩියෙන් දක්වා තිබුණි. | කරුණු සොයා බලා නිවැරදි කිරිමට හා ගෙවිමට කටයුතු කරන බව. | ගිණුම් නිවැරදි කිරීමට හා හිඟ විගණන ගාස්තු ගෙවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | වැලිවිට ගොවිජන සේවා කාරක සභාවේ රු.390,000 ක් වටිනා යූරියා පොහොර කිලෝග්‍රෑම් 2500 කට අදාළ තොගයක් සම්පූර්ණයෙන් ගිණුම්වලින් අත්හැරී තිබුණි. | ලාභට සිදුව තිබූ බලපෑම ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | තොග වටිනාකම් නිවැරදි හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු අතර, මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කළ යුතුය. |
| (එ) | අලවතුගොඩ ගොවිජන සේවා කාරක සභාව විසින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මුළු වත්කම්වල අගය රු.57,454,408 ක් හා මුළු බැරකම් හා හිමිකම් වල අගය රු.57,508,208 ක් ලෙස දැක්වීමෙන් රු.53,800 කින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ තුලනය වී නොතිබුණි. | ඉදිරියේ දී ඒ පිළිබඳ සොයා බලා කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු අතර, අවිනිශ්චිත ශේෂය නිරවුල් කර ගත යුතුය. |
| (ඒ) | මාරස්සන ගොවිජන සේවා කාරක සභාව විසින් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය තුළ දක්වා ඇති මුළු අයභාරයන් හි එකතුව රු.124,613 ක් අඩුවෙන් දක්වා තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු අතර, අදාළ ගැලපීම් කළ යුතුය. |
| (ඔ) | ගලගෙදර ගොවිජන සේවා කාරක සභාව විසින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට අනුව මෙහෙයුම්, ආයෝජන හා මූල්‍ය කටයුතු ශුද්ධ මුදල් ප්‍රවාහය රු.315,577 ක් වුවද එය රු. 2,116,720 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු.1,801,143 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේ දී මේ පිළිබඳ සොයා බලා කටයුතු කරන බව. | අදාළ නිවැරදි මුදල් ප්‍රවාහයන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට හඳුනාගත යුතුය. |
| (ඕ) | මැණික්දිවෙල ගොවිජන සේවා කාරක සභාව ප්‍රවර්ථන වර්ෂයේ ප්‍රාග්ධන වියදම් පුනරාවර්ථන වියදම් ලෙසද බෝවල ගොවිජන සේවා කාරක සභාව පෙර වර්ෂයට අදාළ වියදම් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙසද දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය පිළිවෙළින් රු. 123,100 ක් හා රු.102,174 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන විට නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ප්‍රාග්ධන වියදම් නිසි පරිදි හඳුනාගෙන ප්‍රාග්ධනිත කළ යුතු අතර කාලච්ඡේද සංකල්පයට අනුව වර්ෂයට අදාළ වියදම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

### 1.3.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාරස්සන ගොවිජන සේවා කාරක සභාවේ බීජ හා වෙනත් පොහොර වෙළඳ ගිණුම් ශේෂයන් අදාළ ප්‍රමාණාත්මක තොග ගිණුම්හි ශේෂයන් අතර රු.522,927 ක නොසැසඳීමක් විය. | 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී නිවැරදි කරන බව. | ගිණුම් ශේෂ සසඳා මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතු අතර, අදාළ ගැලපීම් කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 10 ක ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් විෂයයන් ඇතුළු ලෙජර් ගිණුම් 43 ක එකතු වටිනාකම රු.18,011,339 ක ශේෂ මූල්‍ය ප්‍රකාශනයන් හි දක්වා ඇති ශේෂයන් සමඟ සැසඳීමේදී වෙනසක් පැවතුණි. | ඉදිරියේ දී මූල්‍ය ප්‍රකාශන ශේෂයන් හා එකඟ වන පරිදි ගිණුම් ශේෂයන් පිළියෙල කිරීමට කටයුතු කරන බව. | සැසඳීම් කර ගිණුම් ශේෂ නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කළ යුතු බව. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 04 ක ශේෂ පිරික්සුම හා මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ශේෂවල වටිනාකම රු.3,603,943 ක වෙනසක් ද කාරක සභා 04 ක ස්ථාවර වත්කම් වටිනාකම රු.823,094 ක වෙනසක් ද පැවතුණි. | ඉදිරියේ දී මූල්‍ය ප්‍රකාශන ශේෂයන් හා එකඟ වන පරිදි ගිණුම් ශේෂයන් පිළියෙල කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඇ) | ඒදඬුවාව ගොවිජන සේවා කාරක සභාවේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ණයගැතියන් ලෙස දක්වා ඇති 3,736,021 ක ශේෂය තුළ ඇතුළත් 2017 සිට පැවතුණු රු. 2,175,433 ලැබිය යුතු පොහොර සහනාධාර අත්තිකාරම් මුදල් ශේෂය ණයගැති ලෙජරය අනුව රු. 4,718,752 ක් විය. ඒ අනුව රු. 2,543,319 ක වෙනසක් පැවතුණි. | ඉදිරියේ දී මූල්‍ය ප්‍රකාශන ශේෂයන් හා එකඟ වන පරිදි ගිණුම් ශේෂයන් පිළියෙල කිරීමට කටයුතු කරන බව. | -එම- |

### 1.3.4 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ගොවිජන සේවා කාරක සභා 8 ක මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු දිගු කාලයක සිට පවතින රු.219,193 ක හර හා රු.758,115 ක බැර අවිනිශ්චිත ශේෂයක් නිරවුල් කර නොතිබුණි. | අදාළ ශේෂයන් සංඛ්‍යාව ගොවිජන සංවර්ධන කොමසාරිස්තුමාගේ උපදෙස් පරිදි කටයුතු කරන බව. | ගිණුම් ශේෂ පිළිබඳ සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කළ යුතු බව. |

### 1.3.5 විගණන සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ගොවිජන සේවා කාරක සභා 30 ක මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති එකතුව රු.26,821,696 ක වත්කම් විෂයයන් 176 ක හා එකතුව රු.9,847,014 ක වගකීම් විෂයයන් 158 කට අදාළ ස්ථාවර වත්කම් ලේඛන, උපලේඛන, ශේෂ තහවුරු කිරීම්, ලේඛන හා ලිපිගොනු ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | ගිණුම් වාර්තාවල පැවත දීර්ඝ කාලයක එන පිළිබඳ සොයා බලා කටයුතු කරන අතර ශේෂ පවතින ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කරන අතර අනිකුත් ශේෂ සනාථ කිරීම් ඉදිරියේ දී සකස් කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ තහවුරු කිරීමට අදාළ ලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

### 1.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| i. | මුදල් රෙගුලාසි 110 | ගොවිජන සේවා කාරක සභා 26 ක් විසින් හානි හා පාඩු ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ඉදිරි වර්ෂයේ දී හානි පාඩු ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, අනුකූල නොවූ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| ii. | මුදල් රෙගුලාසි 396 | ගොවිජන සේවා කාරක සභා 08 ක කාලය ඉකුත් වූ රු.92,064 ක වටිනාකමකින් යුතු චෙක්පත් 19 ක් සඳහා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳ සොයා බලා කටයුතු කරන බව | -එම- |
| iii. | මුදල් රෙගුලාසි 880 හා 1981 ඔක්තෝබර් 16 දිනැති අංක 107 දරන ගොවිජන සේවා කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 06 ඡේදය | ගොවිජන සේවා කාරක සභා 40 ක විධායක ලේකම්, ගොවිජන බැංකු ලිපිකරු හා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් ඇප තබා නොතිබුණි. | ඉදිරියේ දී ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප තැබීමට කටයුතු කරන බව. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 08/2009 හා 2009 ජූනි 17 දිනැති අංක 09/2009(1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ගොවිජන සේවා කාරක සභා 36 ක නිලධාරීන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍රය භාවිතා කර නොතිබුණි. | පවතින ඇඟිලි සළකුණු යන්ත්‍ර මගින් පැමිණීම පිටවීම සටහන් කිරීමට කටයුතු කරන බව හා අදාළ නඩත්තු සමාගම් වල උපදෙස් පරිදි පැමිණීම හා පිටවීම වාර්තා ලබා ගැනීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ පරිදි කටයුතු කළ යුතු අතර, අනුකූල නොවූ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කොමසාරිස් චක්‍රලේඛ | | | |
| i | 1986 ඔක්තෝබර් 21 දිනැති අංක 264 දරන චක්‍රලේඛයේ 01 ඡේදය | අදාළ වර්ෂය තුළ කාමර කුලී අයකරගැනීමට කටයුතු කළ යුතු වුවද, ගොවිජන සේවා කාරක සභා 17 ක් සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,108,586 ක කාමර කුලී අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ අදාළ කාමර කුලී 2024 වර්ෂයේ අයකර ගෙන ඇති බවත් පැරණි ශේෂ කපා හැරීමට නියෝජ්‍ය කොමසාරිස්තුමා ගෙන් උපදෙස් ඉල්ලා ඇති බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කර කාමර කුලී අයකරගත යුතු අතර, ඒ අනුව කටයුතු නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| ii | 2016 පෙබරවාරි 09 දිනැති අංක 03/2016 දරන චක්‍රලේඛය | ගොවිජන සේවා කාරක සභා 06 ක අදාළ බල ප්‍රදේශය තුල ලියාපදිංචි ගොවි සංවිධාන 119 න් ගොවිසංවිධාන 297 ක් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරයා විසින් හා ගොවි සංවිධාන 53 ක් විධායක නිලධාරී විසින් පරීක්ෂා කර නොතිබුණි. | ඉදිරියේ දී පරික්ෂණ ආකෘතිය ප්‍රකාරව ගොවි සංවිධාන පරික්ෂා කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු අතර, අනුකූල නොවූ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (ඈ) | භාණ්ඩාගාර චක්‍රලේඛය 1978 දෙසැම්බර් 29 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | චක්‍රලේඛය පරිදි ගොවිජන සේවා කාරක සභා 31 ක් විසින් යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ඉදිරියේ දී ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | ස්ථාවර වත්කම් සඳහා චක්‍රලේඛය පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගත යුතුය. අනුකූල නොවූ පාර්ශව වෙත පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 ඡේදය | ගොවිජන සේවා කාරක සභා 23 ක් මිල කැඳවීමකින් තොරව රු.50,659,579 ක් වටිනා භාණ්ඩ මිලදීගෙන තිබුණි. | හදිසි මිලදී ගැනීම් සඳහා කාරක සභා අනුමැති ලබාගෙන ඇති බවද උපදෙස් දී ඇති පරිදි ඉදිරියේ දී මිල ගණන් කැඳවීමට කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් අනුව කටයුතු කළ යුතු අතර, ඊට අනුකූල නොවූ පාර්ශව වෙත පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 45 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයේ එකතුව රු.27,299,236 ක ශුද්ධ අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව කාරක සභා 37හි ඉකුත් වර්ෂයේ රු.11,212,683 ක අතිරික්තයක් විය. සමාලෝචිත වර්ෂයේ ගොවි බැංකු 45 ට අදාල එකතුව රු.38,680,955 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.32,522,278 විය.

### 2.2 මූල්‍ය ප්‍රතිඵල විශ්ලේෂණය

කාරක සභා 40 කට අදාළ මූල්‍ය ප්‍රතිඵලයේ හි රු.18,843,625 ක් වර්ධනයක් ද කාරක සභා 5 කට අදාළ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,044,594 ක පිරිහීමක් ද නිරීක්ෂණය විය. මෙම වර්ධනයන්ට මූල්‍ය හා වෙනත් වියදම් අඩු වීම, අක්කර බදු ආදායම්, වෙනත් ආදායම් හා ගාස්තු ලැබීම් ඉහල යාම, ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 21 ක් ඒවා පිහිටි ඉඩම්වල අයිතිය පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් පවරා ගැනීමේ කටයුතු ආරම්භ කර ඇති බව හා ඉදිරියේදී පවරා ගැනීමට කටයුතු කරන බව. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි ඉඩම පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 05 ක සමාලෝචිත වර්ෂයේ අවසාන තොගයේ පැවති එකතු වටිනාකම රු.116,824 ක් වූ බීජ තොග ද, එකතු වටිනාකම රු.301,220 ක් වූ කාබනික පොහොර තොග ද කල් ඉකුත් වී පැවතිය ද මෙම තොග 2006 දෙසැම්බර් 08 දිනැති අංක 2006/08 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛ නියමයන් අනුව | තොග පොත් වලින් කපා හැරීම සඳහා කාරක සභා අනුමැතියෙන් පසු ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයට යොමු කිරීමට කටයුතු කර ඇති බව. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විධිමත් පරිදි ප්‍රමාණාත්මක තොග ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | තලාතුඔය ගොවිජන සේවා කාරක සභාව විසින් 2023 වර්ෂයේ දී සුහුරු ගම්මාන වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් දෙදෙනකු සඳහා හරිතාගාර ඉදිකිරීම සඳහා ගොවිජන සේවා බල ප්‍රදේශයේ ගොවීන් තෝරා ගන්නා ලෙස දැනුම් දී තිබිය දී වෙනත් බල ප්‍රදේශයක ගොවියෙකු ප්‍රතිලාභියකු ලෙස තෝරාගැනීම හේතුවෙන් හරිතාගාර ඉදිකරන සමාගම වෙනත් වසමක ඉදිකිරීම් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් ප්‍රතිලාභීන් දෙදෙනෙකු සඳහා දායකත්වය ලෙස ලැබුණු රු.1,000,000 ක මුදල 2023 දෙසැම්බර් මස සිට විගණිත දින දක්වා කාරක සභා ගිණුමේ නිශ්කාර්යයව රඳවා තබාගෙන තිබුණි. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ලබාදෙන උපදෙස් මත මුදල් නිදහස් කිරීමට කටයුතු කරන බව. | විධිමත් පරිදි කටයුතු නොකළ පාර්ශව වෙත පියවර ගැනීමටත්, සිදු නොකළ ව්‍යාපෘති මත රඳවා ගත් මුදල් නිදහස් කිරීමත් කළ යුතුය. |
| (ඈ) | ගිරාගම ගොවිජන සේවා කාරක සභාවේ ගබඩාවට දකුණු පසින් මධ්‍යස්ථාන ඉඩමේ වර්ග අඩි 40 ක පමණ භූමි ප්‍රමාණයක පෞද්ගලික පාර්ශවයක් විසින් අනවසරයෙන් පවත්වාගෙන යනු ලබන බ්ලොක්ගල් වැඩපල සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගෙන තිබූ බවට සාක්ෂි නොවුණි. | දිස්ත්‍රික් කාර්යාලය වෙත මේ වනවිට දැනුම් දී ඇත. | මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර නිත්‍යානුකූලව ක්‍රියා කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන 14 ක ගොවිජන සේවා බල ප්‍රදේශය වසම් 266 ක 2024 යල කන්නයේ වගා කළ හැකි කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර 6617 ක් වූ අතර ඉන් වගා කර ඇති ප්‍රමාණය අක්කර 2457 ක් විය. එය වගා කළ හැකි කුඹුරු ඉඩම්වලට ප්‍රතිශතයක් ලෙස සියයට 37.12 ක් වැනි පහළ මට්ටමක පැවතුණි. | සියළු ඉඩම්වල වී වගාව සිදු නොකළද එළවළු, කන්න බෝග වගා කර ඇති බව. | කෘෂිකාර්මික ඉඩම්වලින් ප්‍රශස්ථ ඵලදායිතාවයක් ලබා ගැනීමට වැඩපිළිවෙලක් යෙදිය යුතු අතර, වගකිවයුතු පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (ආ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන 14 ක ගොවිජන සේවා බල ප්‍රදේශය වසම් 266 2024/2025 මහ කන්නයේ වගා | එකමිටට ගොවි බිමට වැඩ සටහන යටතේ වගා කිරීමට හැකි කුඹුරු සියල්ල වගා | -එම- |

| | | | |
|---|---|---|---|
| | කළ හැකි කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර 6722 ඉන් වගා කර ඇති ප්‍රමාණය අක්කර 3005 කි. එය වගා කළ හැකි කුඹුරු ඉඩම්වලට ප්‍රතිශතයක් ලෙස සියයට 44.7 ක් වැනි පහළ මට්ටමක පැවතුණි. | කරන බව | |
| (ඇ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන 30 ක 2024 වර්ෂය අවසාන වන විට පුරන් කුඹුරු ප්‍රමාණය අක්කර 2415 ක් විය. | වගා නොකරන ලද කෘෂිකාර්මික ඉඩම් වගා කරවීමට කටයුතු කරන බව. | වගා නොකරන කුඹුරු ඉඩම් සම්බන්ධව නීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | ගොවිජන සේවා කාරක සභා 41 ක් 2018 දෙසැම්බර් 31 දිනැති අංක 07/05/12/ගි.වා/තා.ගො දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ ලිපියේ උපදෙස් අනුව කටයුතු කර මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩව පැවත එන එකතුව රු.15,578,872 ක වත්කම් විෂයන් 110 ක් හා එකතුව රු.13,028,535 ක වගකීම් විෂයයන් 113 ක් නිරවුල් කර නොතිබුණි. | ශේෂ නිරවුල් කිරිම සඳහා අවශ්‍ය තොරතුරු ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය වෙත යොමු කර ඇති බව. | කළමනාකරණ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) | ගොවිජන සේවා කාරක සභා 03 ක් විසින් පරිගණක මිලදී ගැනීම සඳහා ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් වෙත රු.1,234,065 ක් ගෙවා තිබුණ ද විගණිත දින වන විටත් මෙම පරිගණකය ආයතනය වෙත ලැබී නොතිබුණි. | ගොවිජන සංවර්ධන කොමසාරිස්තුමාගේ උපදෙස් පරිදි ඒවා ලබාගැනීමට කටයුතු කරන බව. | එම උපකරණ අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (ඊ) | 2020 හා 2021 වර්ෂයන් හි දී පුරන් කුඹුරු අස්වැද්දීමේ ණය ලබා ගත් ගොවීන් 69 දෙනෙකුගෙන් තවදුරටත් රු.1,555,664 ක ණය මුදලක් කුරුඳුවත්ත හා ගිරාගම ගොවිජන සේවා මධ්‍යස්ථාන 02 ක සඳහා අය විය යුතුව පැවතුණි. | ඉදිරියේ දී අයකිරීමට පියවර ගනිමින් පවතින බව | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර, ඒවා කාලීනව අය නොකළ නිලධාරීන්ට පියවර ගත යුතුය. |
| (උ) | ගලගෙදර ගොවිජන සේවා කාරක සභාව විසින් විකුණුම් අවශ්‍යතා ගැන සැළකිලිමත් නොවී මිලට ගැණුම් සිදුකිරීම මත තොග අයිතම 5 ක රු.119,581 ක් වටිනා තොග අයිතමයන් වසර 3 කට අධික කාලයක් තිස්සේ අලෙවි නොවී පැවතුණි. | ඉදිරි වර්ෂයේ දී කල් ඉකුත් වූ තොග ඉවත් කිරීමට කටයුතු කරන බව | ගොවීන්ගේ අවශ්‍යතා හඳුනාගෙන විකිණීම සඳහා භාණ්ඩ මිලදී ගැනීම සිදු කළ යුතු අතර, තොග අලෙවි කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 04 ක ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් ලද කොළ මඩින යන්ත්‍ර 02 ක්, ට්‍රැක්ටර් රථයක්, වල් කපන යන්ත්‍රයක් හා රු.1,000,080 ක් වටිනා Dot Matrix Printer 16 ක් හා රු.950,000 ක් වූ කොම්පෝස්ට් කැබලි කිරීමේ යන්ත්‍ර 05 ක් හා කාරක සභා 10 ක පැළ කුටි 8 ක්, බිම්මල් ගෘහයක් හා හෙළ බොජුන්හලක් ඌන උපයෝජිතව පැවතුණි. | වත්කම් ඉදිරියේදී ඵලදායි ලෙස භාවිතා කිරීමට කටයුතු කරන බව | නිෂ්ක්‍රිය වත්කම් උපයෝජනය සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ගිරාගම ගොවිජන සේවා කාරක සභාව විසින් පාසල් සිසුන්ට ගොවි උපකරණ සහ සම්ප්‍රදායික යෙදවුම් ප්‍රදර්ශනය කිරීම සඳහා කෞතුකාගාරයක් ලෙස භාවිතා කිරීමේ අරමුණින් 2021 වර්ෂයේ රු.208,630 ක් වැය කර ඉදි කර තිබුණු "ගොවි ගෙදර" කුටිය විගණන දින වන විටත් අරමුණුගත කාර්ය සඳහා යොදා නොගෙන වසර 03 ට වැඩි කාලයක් නිෂ්කාර්යව පැවතුණි. | ඉදිරියේ දී වත්කම් ඵලදායි ලෙස භාවිතා කිරීමට කටයුතු කරන බව | නිෂ්ක්‍රිය වත්කම් උපයෝජනය සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.4 පාඩු හා අක්‍රමිකතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 06 ක මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධයෙන් කාරක සභාවලට අයවිය යුතුව තිබුණු රු.2,487,716 ක මුදලක් වගකිවයුත්තන් නිශ්චය කර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද අයකර ගෙන නොතිබුණි. | ශේෂ අයකර ගැනීම සඳහා තොරතුරු දිස්ත්‍රික් කාර්යාලය වෙත යොමු කර ඇති බව | විධිමත් පරිදි පරීක්ෂණ පවත්වා කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගොවිජන බැංකු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන බැංකුව විසින් මෘදුකාංගයක් ස්ථාපිත කිරීම සඳහා Scanner යන්ත්‍රයක් සහ Dot Matrix Printer 02 ක් මිලදී ගැනීම සඳහා ගොවිජන සේවා කාරක සභා 30 කින් රු.7,314,726 ක මුදලක් ගෙවා තිබුණද, 2024 දෙසැම්බර් 31 දින වන විටද අදාළ මෘදුකාංගය ස්ථාපිත නොකිරීම මත එම උපාංග නිශ්කාර්යයව පැවතුණි. | එක් උපකරණයක් මේ වනවිට ලැබී ඇති අතර අනෙක් උපකරණ දෙක ගිණුම් ගත කළ යුතු ආකාරය පිළිබඳව දිස්ත්‍රික් කාර්යාලයෙන් උපදෙස් ඉල්ලා ඇති බව. | මෘදුකාංගය කඩිනමින් නිවැරදිව ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2023 අප්‍රේල් 24 දිනැති අංක 01/2023 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ 2.1.1 වගන්තිය ප්‍රකාරව එක් එක් ගොවිජන බැංකු (නියමු) ව්‍යාපෘතියේ වාර්ෂික අවසන් ගිණුම් වාර්තාව අනුව ශුද්ධ උපලබ්ධි ලාභයෙන් සියයට 10 ක් ණය අවදානම් සඳහා ගොවි ආපදා ණය ආවරණ ගිණුමට වෙන් කිරීම වාර්ෂිකව සිදු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 21 ක එලෙස වෙන් කිරීම් සිදුකර නොතිබුණි. | 2025 සිට ශුද්ධ උපලබ්ධි ලාභයෙන් සියයට 10 ක් වෙන් කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (ඇ) | 2020 ජුනි 11 දිනැති අංක 7/12/8/01 දරණ ලිපිය අනුව ගොවි ආපදා ණය ආවරණ ගිණුමෙහි පවතින මුදල් ඉතිරිකිරීමේ ගිණුමේ උපරිම රු.25,000 ක ශේෂයක් රඳවාගෙන ඉතිරි මුදල් වැඩි පොලියක් ලැබෙන ස්ථාවර තැන්පතු ගිණුමක තැන්පත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අවසාන වන විට ගොවි බැංකු 19 ක ගොවි ආපදා ණය අරමුදල් ගිණුමේ ශේෂය සම්බන්ධයෙන් ඉහත විධි විධාන අනුව කටයුතු කර නොතිබුණි. | ස්ථාවර තැන්පතු ගිණුමක තැන්පත් කිරීමට කටයුතු කරන බව | -එම- |
| (ඈ) | ගොවිජන බැංකු 42 ක සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොවීන් 4.132 දෙනෙකුට ලබා දී තිබුණු ණය මුදලින් එකතුව රු.119,275,303 ක හිඟ ණය ශේෂයක් ද රු.13,355,932 ක හිඟ ණය පොළියක්ද මාස 6 ත් වර්ෂ 27 ත් අතර කාලයක් කල් පසු වී ඇතත් අය කර ගෙන නොතිබුණි | මේ වන විට එම ණය හා පොලී අය කර ගැනීම සඳහා විනිශ්චය සභාවට හා අධිකරණය වෙත අදාල ගොනු යොමු කරමින් පවතින බව. | ණය ලබා දීම හා හිඟ ණය කාලීනව අය නොකිරීම පිළිබඳ විධිමත් පරීක්ෂාවක් කර අදාළ පාර්ශව වෙත පියවර ගැනීමත්, හිඟ ණය ශේෂ අය කර |

| | | | |
|---|---|---|---|
| | | | ගැනීමට කටයුතු කිරීමත් කළ යුතුය. |
| (ඉ) | ගොවිජන බැංකු 28 ක තැන්පතු ශේෂ 151 ක කේවල ශේෂ ලැයිස්තු ඉදිරිපත් නොකිරීම මත සහ ඉදිරිපත් කල ඇතැම් ශේෂ ලැයිස්තු අසමාන වීම මත එකතුව රු.282,084,493 ක කේවල ශේෂවල නිවැරදිතාවය තහවුරු කරගත නොහැකි විය. | ඉදිරියේදී කේවල ශේෂ ලැයිස්තු යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | තැන්පතුවලට අදාළ උපලේඛන ඉදිරිපත් කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයට අදාළව ගොවි බැංකු 13 ක් ස්ථාවර තැන්පත් පොලී රු.1,566,807 ක් වැඩියෙන් ද ගොවි බැංකු 11 ක් ස්ථාවර තැන්පත් පොලී රු.690,647 ක් අඩුවෙන් ද ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේ දී ගිණුම් නිවැරදිව සකස් කරන බව. | කාල පරිච්ඡේදයට අදාළ ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු අතර, අදාළ ගැලපීම කළ යුතුය. |
| (උ) | 2012 පෙබරවාරි 29 දිනැති අංක 4/2012 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ 7 වන වගන්තිය හා 2021 ජූලි 15 දිනැති අංක 7/12/4/5 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ සංශෝධිත ලිපිය ප්‍රකාරව ගොවි බැංකුව විසින් වර්ෂයේ ලාභයෙන් ලාභාංශ වෙන් කළ යුතු යැයි දැක්වුවද සමාලෝචිත වර්ෂයේ ගොවිජන බැංකු 20 ක එලෙස වෙන් කිරීම් සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. | 2025 වර්ෂයේ ගිණුම් සැකසීමේදී ලාභාංශ වෙන් කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ඌ) | 2020 ජුනි 24 දිනැති අංක 09/2020 – 04/2012 (සංශෝධන I) දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ 3.8.6 ඡේදය අනුව ව්‍යාපෘති ණය සඳහා ධනයෝජන ගිණුම් ආරම්භ කළ යුතු වුවත් ගොවිජන බැංකු 19 ක ධනයෝජන ගිණුම් ආරම්භ කර නොතිබුණි. | ඉදිරියේ දි සෑම ව්‍යාපාති ණය කරුවකු සඳහාම ධනයෝජන ගිණුමක් ආරම්භ කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු අතර, එසේ නොකළ පාරශව වෙත පියවර ගත යුතුය. |
| (ඍ) | 2014 ජුලි 09 දිනැති අංක 05/2014 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය අනුව පෙරමග ළමා තැන්පත් ගිණුම්වල තැන්පතු ශේෂ වයස අවුරුදු 18 ඉක්ම වූ ගිණුම් හිමියන් සඳහා සාමාන්‍ය ඉතුරුම් ගිණුම්වලට මාරු කළ යුතු වුවත් ගොවිජන සේවා කාරක සභා 14 ක එලෙස කටයුතු කර නොතිබුණි. | සාමාන්‍ය ඉතුරුම් ගිණුම්වලට මාරු කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු අතර එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඔ) | 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ 3.4.11 (i) ඡේදය ප්‍රකාරව ආපදා ණය ආවරණ ගිණුමට රැස්වෙන මුදල් රාජ්‍ය බැංකුවක වැඩි පොලී ලැබෙන ඉතිරි කිරීමේ ගිණුමක රඳවා තබා ගත යුතු වුවත්, එසේ වෙනම ඉතිරි කිරීමේ ගිණුමක් ආරම්භ කර නොතිබුණු ගොවිජන සේවා කාරක සභා 4 ක් පැවතිණි. | ඉතිරි කිරිමේ ගිණුමක් විවෘත කිරිමට කටයුතු කරන බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ඕ) | යටිවාවල, වාවින්න සහ මැදවල ගොවි බැංකුවල එකතුව රු.365,062 ක අවිනිශ්චිත ගිණුම් ශේෂයන් පැවතුණි. | අදහස් දක්වා නොතිබුණි. | වෙනසට හේතු හඳුනාගෙන ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |
| (ක) | ගොවිජන සේවා කාරක සභා 16 ක අදාළව ශේෂයන් 48 ක මූල්‍ය ප්‍රකාශනයන් හි දක්වා ඇති ශේෂයන් උපයෝගී වාර්තා සමග සැසඳීමේදී එකතුව රු.29,039,958 ක වෙනසක් පැවතුණි. | නිවැරදි කිරිමට කටයුතු කරන බව. | විධිමත් පරිදි සැසඳීම් කර ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |